**දිඹුලාගල ප්‍රාදේශීය සභාව**

**පොළොන්නරුව දිස්ත්‍රික්කය**

**--------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන.

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 07 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 09 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2017 ජුනි 28 දින සභාවේ ලේකම්වරිය වෙත යවන ලදී.

1.2 <u>තත්ත්වාගණනය කළ මතය.</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

--------------------------

ගබඩා ද්‍රව්‍ය සම්බන්ධයෙන් ගබඩා අත්තිකාරම් ගිණුම් ක්‍රමය අනුගමනය කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ මිළදී ගත් එකතුව රු. 1,519,130 ක් වූ වත්කම් ඒකක 14 ක වටිනාකම ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) රු. 651,205 ක හිඟ වෙළඳ බලපත්‍ර ආදායමක් මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 256,310 ක ටෙන්ඩර් ඇප ශේෂයක් මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි.

(ඈ) උතුරු මැද පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු. 64,830 ක් ගිණුම්වල අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) 2016 අප්‍රේල් 06 දින ප්‍රාදේශීය සභාව වෙත දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් පවරා දී තිබුණු දිඹුලාගල ආදාහනාගාරයේ වටිනාකම වූ රු. 5,142,857 ක් මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි.

(ඊ) ආගමික සිද්ධස්ථාන හා ඒ ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට අදාළව වැයකළ රු. 3,900,000 ක මුදල ප්‍රාග්ධන වියදම් යටතේ දැක්විය යුතු වුවත් එය පුනරාවර්තන වියදම් යටතේ දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයට හා පූර්ව වර්ෂ 03 කට අදාලව ගෙවිය යුතු විගණන ගාස්තු සඳහා මූල්‍ය ප්‍රකාශන වල වෙන්කිරීම් සිදුකර නොතිබුණි.

(ඌ) ප්‍රාදේශීය සභා බලප්‍රදේශයට අයත් සුසාන භූමි 57 කට අදාල වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(එ) ස්ථාවර වත්කම් වටිනාකම සහ ප්‍රාග්ධන යෙදූමට අදායමෙන් දායකවීමේ ගිණුම අතර රු. 41,445,554 ක වෙනසක් පැවතුණි.

1.3.3. නොසැසඳු පාලන ගිණුම්

----------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ගිණුම් විෂයයන් 06 කට අදාළ පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව අවසාන ශේෂය හා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ආරම්භක ශේෂයන් අතර රු. 7,895,238 ක නොසැසඳීම් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අදාල ලේඛන අනුව හා මූල්‍ය ප්‍රකාශන අනුව රු. 10,293,064 ක නොසැසඳීම් තිබුණි.

1.3.4 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

-----------------------------------

(අ) වසර 3 සිට 6 දක්වා කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම හෙළිදරව් කරමින් තිබෙන රු. 1,000,023 ක පොල බදු ආදායම අයකරගැනීමට අදාල ක්‍රියාමාර්ග සමාලෝචිත වර්ෂය තුලදීද ගෙන නොතිබුණි.

(ආ) වසර 2 සිට 7 දක්වා කාලයක් තිස්සේ ගිණුම්වල දක්වා තිබෙන රු. 4,406,386 ක ගෙවියයුතු කර්මාන්ත ණයහිමි ශේෂ නිරවුල් කර නොතිබුණි.

1.3.5 විගණනය සඳහා අවශ්‍යා ලිඛිත සාක්ෂි නොවීම

---------------------------------------------------

(අ) පසුගිය වර්ෂවල නිකුත් කළ විගණන විමසුම් 6 කට 2017 අප්‍රේල් 30 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර එකී විමසුම් වලට භාජනය වූ ගණුදෙණු වල ගණනය කළ හැකි වටිනාකම රු. 71,646,655 ක් විය.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. 152,193,054 ක් වූ වත්කම් විෂයයන් 08 ක්,රු. 10,785,174 ක් වූ වගකීම් විෂයයන් 03 ක් සහ රු. 1,069,745 ක් වූ ආදායම් විෂයයකට අදාළව සාක්ෂි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

1.3.6 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

-------------------------------------------------------------------------

පහත දැක්වෙන නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) රීති අංක 59 සිට 63 | සභා බලප්‍රදේශය තුළ සමීක්ෂණයක් පවත්වා කර්මාන්ත හා වෙළඳ ව්‍යාපාර පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර ඒ අනුව ලේඛන ගතකර ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි |
| (ii) රීති අංක 203, 214 හා 218 | සභාවේ දේපල සම්බන්ධව පූර්ණ සමීක්ෂණයක් කර නොතිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය

-----------------------------------------

| | |
|---|---|
| xix පරිච්ඡේදයේ 5.2.1 උප වගන්තිය | විවාහක නිලධාරියෙකුගේ මූලික වැටුපෙන් නිවාස කුලී ලෙස සියයට 12.5 ක් අයකළ යුතු වුවත්, ලේකම් නිල නිවසේ පදිංචිව සිටින නිලධාරිණියගෙන් අඩුවෙන් කුලී අයකිරීම හේතුවෙන් සභාවට රු. 38,180 ක පාඩුවක් සිදුවී තිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

-----------------------------------

| | |
|---|---|
| (i) මු.රෙ. 396 (ඇ) | 2016 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ මාස 06 ඉක්මවූ රු. 1,049,533 ක් වටිනා චෙක්පත් 114 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ii) මු.රෙ. 571 හා 572 | තැන්පත් කර වසර 2 සිට 8 දක්වා කාලයක් ගතවී ඇති රු. 414,920 ක් වටිනාකමැති ටෙන්ඩර් ඇප තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (iii) මු.රෙ. 754 | සමාලෝචිත වර්ෂයට අදාළව විදුලි බඩු ලැබීම් නිකුත් කිරීම් පිළිබඳ තොග ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (iv) මු.රෙ. 1645 (අ) හා (ආ) | සමාලෝචිත වර්ෂයේ රු .171,256 ක වාහන අළුත්වැඩියාවන්, සේවා කිරීම් හා අමතර කොටස් මිලදී ගැනීම් ලොග් සටහන් පොත්වල සටහන් කර නොතිබූ අතර සභාව සතු වාහන 17 ක දෛනික ධාවන සටහන් පිළියෙල කර නොතිබුණි. |

(ඇ) චක්‍රලේඛ හා චක්‍රලේඛ ලිපි

-----------------------------------

| | |
|---|---|
| 2015 මැයි 18 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ NCP/LG/AC/4/1/2 දරන ලිපිය | සභාපතිවරයා වෙත වෙන්කර ඇති නිල වාහනය 2015 දෙසැම්බර් මස සිට මසකට ලීටර් 150 ක උපරිම ඉන්ධන සීමාවකට යටත්ව ලේකම්වරුන් විසින් භාවිතා කළ හැකි වුවත්, ඊට අනුකූල නොවන ලෙස සමාලෝචිත වර්ෂයේදී අදාල ඉන්ධන සීමාව ඉක්මවා ඩීසල් ලීටර් 2388 ක් යොදවා රු. 226,860 ක් වැයකර තිබුණි. |

02. මූල්‍ය සමාලෝචනය

------------------------

2.1. මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු. 12,233,446 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 14,098,539 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

-----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්. තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

----------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2016 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | 2016 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---:|---:|---:|
| | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 25,866,000 | 14,876,798 | 7,053,119 |
| කුලී | 13,938,656 | 3,012,375 | 837,174 |
| බලපත්‍ර ගාස්තු | 694,000 | 823,505 | 1,438,570 |
| වෙනත් | 12,754,400 | 8,827,328 | 6,646,487 |

2.2.2 වරිපනම්

-----------

වර්ෂය තුළ බිල්කළ වරිපනම් හා බදු ආදායම රු. 16,241,253 ක් වුවද එයින් රැස්කළ ආදායම රු. 12,523,317 ක් හෙවත් සියයට 77 ක් වූ අතර වර්ෂය ආරම්භයේ පැවති රු. 5,688,663 ක මුදලින් රැස්කර තිබුණේ රු. 2,353,480 ක් හෙවත් සියයට 41 ක් පමණි. හිඟහිටි වරිපනම් හා බදු සම්බන්ධ පනතේ 158 වගන්තිය ප්‍රකාර අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 බදුකුලී

---------

වර්ෂය තුළ බිල්කළ කුලී මුදල් ආදායම වූ රු. 3,818,999 න් අයකර තිබුණු මුදල රු. 3,759,489 ක් හෙවත් සියයට 98 ක් වූ අතර වර්ෂ ආරම්භයේ පැවති රු. 894,281 ක හිඟ ශේෂයෙන් රු. 777,664 ක් වර්ෂය අවසාන වන විටත් හිඟව පැවතුන නමුත් එම මුදල් අයකර ගැනීමට කුලී ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.2.4 බලපත්‍ර ගාස්තු

----------------

වර්ෂය ආරම්භයේ හිඟව පැවති රු. 1,454,855 ක් වූ බලපත්‍ර ගාස්තු ආදායමින් වර්ෂය තුළ රැස්කර තිබුණේ රු. 16,825 ක් හෙවත් සියයට 1 වැනි ඉතා පහළ අගයකි.

2.3. නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

----------------------------------------

(අ) උතුරුමැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශය 2007 වර්ෂයේදී ප්‍රාදේශීය සභාව වෙත ලබාදුන් රු. 541,000 ක් වටිනා සහල් පිටි නිෂ්පාදන උපකරණ කට්ටලය කිසිදු නිෂ්පාදනයකට යොදා නොගෙන වසර 10 කට අධික කාලයක් තිස්සේ නිෂ්කාර්යව තබා තිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාව විසින් 2014 වර්ෂයේදී රු. 939,167 ක වියදමක් දරා කඩ කාමර 6 ක අත්තිවාරම් දමා කොන්ක්‍රීට් කණු පමණක් සකස්කර මේ වන විට වසර 2 කට අධික කාලයක් ගතවී ඇති බැවින් ඉදිකර ඇති කොන්ක්‍රීට් කණු සඳහා යොදා ඇති දගර වානේ හා මෘදු වානේ කම්බි අව්වට සහ වැස්සට නිරාවරණයවීම නිසාවෙන් මලබැඳීමකට ලක්වෙමින් පවතින බව හා අත්තිවාරම් දමා ඇති බැම්ම විනාශ වෙමින් පවතින බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

(අ) නිලධාරීන් 07 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 430,581 ක් වටිනා සේවක ණය ශේෂයක් වසර 1 සිට 8 දක්වා කාලයක සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2015 වර්ෂයේ භාවිතා කළ විදුලි භාණ්ඩ නිකුත් කිරීම් ලේඛනයට අනුව 2017 පෙබරවාරි 14 දින වන විට ඉතිරිව පැවති රු. 186,300 ක් වටිනා CFL බල්බ 414 ක් ඇතුලු අනෙකුත් ඉතිරි විදුලි බඩු කිසිවක් භෞතිකව නොතිබූ අතර ඒ පිළිබඳ සොයා බලා වගකිව යුතු පාර්ශවයන් හදුනාගෙන අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කසල කළමනාකරණය සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු. 4,996,731 ක් වැයකර තිබුණු නමුත් කසල බදු අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොමැති වීම හේතුවෙන් ලැබිය යුතු ආදායමක් අහිමි වී තිබුණි.

(ඈ) දැනට සභාවේ සේවය කරන නිලධාරිණියකට හා දිඹුලාගල කලාප අධ්‍යාපන කාර්යාලයට ස්ථාන මාරු වී ගිය නිලධාරියෙකුට සියයට 40 ණය සීමාව ඉක්මවා බැංකු ණය පහසුකම් ලබාගැනීම සඳහා සභාව විසින් ව්‍යාජ වැටුප් විස්තර ලබාදී තිබුණි.

(ඉ) 2014 දෙසැම්බර් 16 දින සභාව වෙත ලැබී තිබුණු ගැල්වනයිස් බට 360 ක් ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් විසින් රැගෙනගොස් තිබුණු නමුත් ඒවා 2017 පෙබරවාරි 14 දින වන විටත් සභාව වෙත භාරදී නොතිබීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඊ) අංක 3981 සිට 4180 දක්වා වූ මනුපොත් (ජලය) 200 ක් උප පත්‍රිකා පොත් ලේඛනයේ සටහන් කර නොතිබුණි.

3.2 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

(අ) කසළ බැහැර කිරීම සඳහා ශ්‍රී ලංකා මහවැලි සංවර්ධන අධිකාරිය විසින් 2012 වර්ෂයේදී අරලගංවිල දඹගහ උල්පත ප්‍රදේශයෙන් ලබාදී තිබුණු අක්කර 05 ක ඉඩම වසර 04 කට අධික කාලයක් ගතවී ඇතත් නිත්‍යානුකූලව පවරාගෙන නොතිබූ අතර දෛනිකව එකතුවන ටොන් 7.5 කට අධික කසල විධිමත් ක්‍රමවේදයක් අනුගමනය නොකර එම විවෘත භූමියට බැහැර කිරීම දක්නට ලැබුණි. මෙම අපද්‍රව්‍ය අසල වනසතුන් ගැවසීම හා ප්‍රදේශයේ දැඩි දුර්ගන්ධයක් පැවතීම වැනි

විවිධ පාරිසරික හා සෞඛ්‍ය ගැටලු ඇති වී ඇති බැවින් ඒ පිළිබඳව අවධානය යොමුකර කසල ප්‍රතිචක්‍රීයකරණය සඳහා විධිමත් වැඩ පිළිවෙලක් කඩිනමින් ආරම්භ කිරීමට සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

3.3 කාර්ය මණ්ඩල පරිපාලනය

--------------------------------

ද්විතියික මට්ටමේ තනතුරු 02 ක්, ප්‍රාථමික මට්ටමේ තනතුරු 35 ක් සහ අනියම් පදනම මත බඳවාගත් සේවකයින් 16 ක් ඇතුළුව තනතුරු 53 ක අතිරික්තයක් පැවති අතර එම සේවකයින්ගේ පත්වීම් ලිපිවලටඅනුව රාජකාරී නොපවරා වෙනත් රාජකාරී පවරා තිබුණි.

3.4 අභ්‍යන්තර විගණනය

------------------------

අභ්‍යන්තර විගණනයක් ආයතනය තුල ක්‍රියාත්මක කර නොතිබූ අතර විමර්ශන නිලධාරීන්ගේ කාර්යාල පරීක්ෂා වලින්ද ප්‍රමාණවත් ආවරණයක් ලැබී නොතිබුණි.

**4. පද්ධති හා පාලන**

**---------------------**

පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම් පාලනය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය

(ඈ) ණයගැති/ණයහිමි පාලනය

(ඉ) අභ්‍යන්තර පාලනය

(ඊ) වාහන පාලනය